**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජුනි 30 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සේවකයින් 17 දෙනෙකුගේ ඇප තැන්පත් රු.26,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රු.83,276 ක් උපචිත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූලධන වැය විෂය යටතේ වෙන්කරන ලද ණයහිමි වටිනාකම රු.2,996,724 ක් උපලේඛන අනුව රු.5,045,581 ක් ලෙස නිරූපණය විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.8,589,295 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.11,511,721 ක් විය.

#### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 71,986,229 ක් වටිනා වත්කම් ගිණුම් විෂයන් 04 ක අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

#### 1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) | |
| (i) රීති 5(7) | අභ්‍යන්තර විගණනයක් කර නොතිබුණි. |
| (ii) රීති 218 | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු. රෙ.371 | 2016 දෙසැම්බර් 31 දිනට අවස්ථා 04 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද අත්තිකාරම් රු.67,500 ක් අයකර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 | 2016 දෙසැම්බර් 31 දිනට රු.286,450 ක් වටිනා තැන්පත් 16 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 හා 4 වගන්ති | විශ්‍රාම ගිය, මිය ගිය සේවකයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.5,247 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) 1985 අංක 1 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තිය | 2001 දෙසැම්බර් සිට 2013 ඔක්තෝබර් දක්වා කාලයට සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.53,184 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. . |
| (ඉ) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/C/01/PAHA/15 හා 2008.03.05 දිනැති ලිපිය | අනුමැතියකින් තොරව රු.44,174 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| (ඊ) 1988 අංක 56 හා 2000 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 49 දරන ජාතික පාරිසරික පනත | වී මෝල් 33 ක් හා ගල් වලවල් 09 සඳහා පරිසර බලපත්‍ර අංක 52 ලබාදී නො තිබුණි. |
| (උ) පළාත් පාලන කොමසාරිස් ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | 1996 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත මාසික බදු කුලිය බිල් කර තිබුණි. |
| (ඌ) රාජ්‍ය පරිපාලන පළාත් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 1990 ඔක්තෝබර් 10 දින නිකුත් කළ චක්‍රලේඛ අංක 41/91 හි 2:11 ඡේදය | සමාලෝචිත වර්ෂයේ වාහන 03 සම්බන්ධව ඉන්ධන සභා හා දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,715,471 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,633,121 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

----------------------------------------

2016 ජනවාරි 01 දිනට පැවති ජල ගාස්තු හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 41 ක මට්ටමක පවතුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු1,951,528 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

(අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධි විධාන පනතට අනුව රු.18,550 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) රු.455,839 ක් වන දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදලට ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) 1971 අංක 08 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තිය අනුව 2008 වර්ෂයේ දී අයකරනු ලැබූ අර්ථ සාධක දායක මුදල් රු.455,839 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.



3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

ජල යෝජනා ක්‍රම 04 ක ජල පාරිභෝගිකයින් 463 දෙනෙකුගෙන් ජල මනු සවිකිරීමකින් තොරව ජලය පාවිච්චිය සඳහා රු.200 සිට 300 දක්වා ස්ථාවර ගාස්තුවක් පමණක් අයකර ගෙන තිබුණි.

3.3 **මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

--------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ලබාදුන් අංක **WP-ZA** 5321 දරන රු.24,928,616 ක් වටිනා මෝටර් ග්‍රේඩරය රක්ෂණය කර නොතිබුණි.

3.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

යන්ත්‍ර හා මෝටර් රථ 03 ක් වසර 1 ½ සිට වසර 04 ක කාලයක සිට නිශ්ක්‍රියව පැවතිණි.

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

කසළ වර්ග කර ප්‍රතිචක්‍රීය කළ යුතු වුවත්, එක්රැස් කරනු ලබන කසල නුවර මාර්ගයේ මහවැලි සංවර්ධන අධිකාරියට අයත් ඉඩමකට බැහැර කරමින් තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) තොග පාලනය
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පාලනය